# මැවීම

– 1st Story–




3Page

**පොතේ ගුරා** පටන්ගැන්මේදී ලෝකය පාළුව හිස්ව තිබුණේය.
කිසිවක්ම තිබුණේ නැත. දෙවියන්වහන්සේ පමණක් වැඩ සිටිය සේක.
එක් දවසක දී දෙවියන්වහන්සේ කතා කළ සේක.

**දෙවියන්වහන්සේ** එළිය වේවා !

**පොතේ ගුරා** දීප්තිමත් එළිය ලෝකය මතට පැමිණුනේය.
දෙවියන්වහන්සේ එළිය යහපත් බව දුටු සේක.
උන්වහන්සේ එළියට දහවල කියා ද රාත්‍රියට අන්ධකාරය කියා ද නම් තැබූ සේක. එය පළමුවෙනි දවසය.

..............................................................................................




4Page

**පොතේ ගුරා** දෙවියන්වහන්සේ දෙවැනි දවසේ නැවත කතා කළ සේක.

**දෙවියන්වහන්සේ** අවකාශය සහ ජලය වේවා !

**පොතේ ගුරා** අවකාශය සහ ජලය මැවීමෙන් පසුව එය ඉතා ලස්සනට තිබුණේය.

..............................................................................................




5Page

**පොතේ ගුරා** තුන්වෙනි දවසේ උන්වහන්සේ ජලය එක් තැනකට එයට වියළිබිම මතු කළ සේක.

**දෙවියන්වහන්සේ** වියළිබිම පොළව වේවා ! රැස් වූ ජලය මුහුද වේවා !

**පොතේ ගුරා** දෙවියන්වහන්සේ ලස්සන සුවඳවත් මල් සහ තද කොළ පැහැති පලාද, වෘක්ෂද වර්ධනය වීමට සැලැස්වූ සේක.
මේ සියල්ල යහපත් බව දෙවියන්වහන්සේ දුටු සේක.

..............................................................................................




6Page

**පොතේ ගුරා** හතරවන දවසේ දෙවියන්වහන්සේ මෙසේ කී සේක.

**දෙවියන්වහන්සේ** ඉර, හඳ, තාරකාවන් අහස්තලයෙහි ඇතිවෙත්වා !

**පොතේ ගුරා** ඒ දවසේ දී ඉර දීප්තිමත්ව නැගී ඇවිත් ආලෝකය දුන්නේය.
රාත්‍රී කාලයේ දී හඳ සහ තාරකාවන් ඉතා ලස්සනට බැබළුණේය.
දෙවියන්වහන්සේගේ මැවිල්ල හැමදේම යහපත්ව තිබුණේය.

..............................................................................................



7Page

**පොතේ ගුරා** පස්වෙනි දවසේදී දෙවියන්වහන්සේ මෙසේ කී සේක.

**දෙවියන්වහන්සේ** පක්ෂීන් පොළවට උඩින් ආකාශයෙහි පියාසර කෙරෙත්වා. ජලයෙහි ජීවත් වන සතුන් එහි වේවා !

**පොතේ ගුරා** ලස්සන කුරුල්ලන් ආකාශයෙහි එහා මෙහා පියාසර කළේය.
ගංගා සහ මුහුදේ විවිධ වර්ගයේ මාළුන්ගෙන් හා අනෙක් ජලචර සතුන්ගෙන් පිරී තිබුණේය.
හයවන දවසේ දෙවියන්වහන්සේ පොලොවෙහි ජීවත් වන ජීවමාන සත්වයා මැවූ සේක.

| | |
|---|---|
| දෙවියන්වහන්සේ | ජීවමාන සත්වයන් ඒ ඒ වර්ග ලෙස බෝ වේවා ! |
| පොතේ ගුරා | ජීවමාන සත්වයෝ ඒ ඒ වර්ග ලෙස බිහි කළේය. විශාල ශක්තිමත් අලියා, කුඩා ලස්සන හාවෝ, නිර්භීත කොටියන් වැනි විවිධාකාර සත්වයන් දෙවියන්වහන්සේට ප්‍රශංසා කළේය. දෙවියන්වහන්සේද සතුටු වූ සේක. |

.................................................................................................



8Page

| | |
|---|---|
| පොතේ ගුරා | අවසානයේ දී දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ස්වරූපයෙන් මනුෂ්‍යා මැවූ සේක. මනුෂ්‍යා දූවිල්ලෙන් සෑදූ සේක. ඔහුගේ නාස්පුඩු තුළට ජීවනයේ හුස්ම හෙළූ සේක. එවිට ඔහු ජීවමාන ප්‍රාණයක් විය. මේ පළමු මිනිසා ආදම් නම් විය. ඔහු සමග දෙවියන්වහන්සේ කතා කළ සේක. |
| දෙවියන්වහන්සේ | නුඹලා බෝව් වැඩිවෙනන්. මුහුදේ මත්ස්‍යයන් කෙරෙහි ද, ආකාශයෙහි පක්ෂීන් කෙරෙහි ද, සියලු ජීවමාන සත්වයන් කෙරෙහි ද ආණ්ඩු කෙරෙත් වා ! |
| පොතේ ගුරා | දෙවියන්වහන්සේ තමන් මැවූවාවූ සෑදූවා වූ ස්වකීය වැඩ වලින් 7 වෙනි දවසේ දී නිවාඩු ගත් සේක. උන්වහන්සේ 7 වෙනි දවසට ආශිර්වාද කොට එය ශුද්ධයැයි නියම කළ සේක. අපි දෙවියන්වහන්සේගේ දරුවන් හැටියට 7 වන දවසේ දී විවේකය ගත යුතුය. එම දින දෙවියන්වහන්සේට ශුද්ධ දිනයක් ලෙස සැමරිය යුතුය. |

.................................................................................................

| | |
|---|---|
| ජිවිතයට අදාල කිරීම | දුවේ පුතේ, මේ ලෝකය අහම්බෙන් සෑදුනු එකක් නොවේ. විශ්මිත ලෝකය සාදන්න විශ්මිත නිර්මාණකරුවාණන් කෙනෙක් සිටින්නට ඕන. ඒ තමයි මේ අපි කතා කරන මැවුම්කාර දෙවියන්වහන්සේ. |